**ශීර්ෂය 117- මහාමාර්ග වරාය හා නාවික අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ හා 2 ඡේදයේ අමාත්‍යාංශය පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

## 1.1 විගණන විෂය පථය

මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 සැප්තැම්බර් 07 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

## 2.1 විසර්ජන ගිණුම

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 144,265 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 133,304 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 10,961 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එය සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 7.60 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 361.60 | 361.39 | 0.21 | 0.06 |
| මූලධන | 143,903.76 | 132,942.17 | 10,961.59 | 7.62 |
| එකතුව | 144,265.36 | 133,303.56 | 10,961.80 | 7.60 |

## 2.2 අත්තිකාරම් ගිණුම

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 11701 | 9.00 | 8.82 | 3.60 | 6.08 | 40.00 | 26.97 |

**2.3 අග්‍රිම ගිණුම්**

අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂ එකතුව රු.132,297 ක් විය. විස්තර පහත දැක්වේ.

| **අමාත්‍යාංශය** | **අග්‍රිම ගිණුම් අංකය** | **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|---|
| | | රු. |
| මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය | 7002/0000/00/0332/0014 | 31,700 |
| | 7003/0000/00/0054/0014 | 100,597 |
| **එකතුව** | | **132,297** |

**2.4 පොදු තැන්පත් ගිණුම**

අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 369.39 ක් විය.

**2.5 විගණන නිරීක්ෂණය**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරික්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරික්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

## 3. ශීර්ෂය 117 - මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (iii) | ලැබෙන චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය සඳහා වූ ලේඛනය | මුදල් රෙගුලාසි 451 |
| (iv) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |
| (v) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| (vi) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 |
| (vii) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647(ඉ) |
| (viii) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891 |

### 3.2 විගණන විමසුම්වලට පිළිතුරු දීම

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුමකට 2015 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුමට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.8,332,466 ක් විය.

### 3.3 විසර්ජන ගිණුම

**අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය විසින් 2013 දෙසැම්බර් 04 දිනැති අංක 05/2013 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වර්ෂය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුව පදනම් කරගෙන අවශ්‍ය අග්‍රිම සීමාවන් දක්වා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණි. එම සීමාවන් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින්

අනුමත කර තිබුණි. අනුමත කළ සීමාවන් අනුව ඒ ඒ මාසවලදී අපේක්ෂා කළ පරිදි අග්‍රිම අමාත්‍යාංශය වෙත භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර නොතිබීම නිසා පහත සඳහන් වැය විෂයයන් සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් සළසා තිබුණු රු. මිලියන 3,365.57 ක ප්‍රතිපාදන උපයෝජනය කිරිමට නොහැකි වි තිබුණි.

(ආ) වැය විෂයයන් 06 ක් සඳහා සළසා තිබුණු එකතුව රු.මිලියන 308.60 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ඇ) වැය විෂයයන් 05 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 51 ක සිට සියයට 93 ක් දක්වා වූ පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ඈ) 2014 දෙසැම්බර් 31 දින වන විට අමාත්‍යාංශය විසින් මුදල් රෙගුලාසි 94(1) ට පටහැනිව වැය විෂයයන් 54 කට සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනයන් කළ පසු ඉතිරිය ඉක්මවා රු.මිලියන 34,092.95 ක බැරකම්වලට එළඹ තිබුණි.

### 3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 11701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරික්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,693,198 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 1ක සිට වර්ෂ 20. ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, *එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත්වී තිබුණි.*

(ආ) මියගිය, විශ්‍රාම ගිය, වෙනත් රාජ්‍ය ආයතනවලට මාරු වී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතුව තිබුණු එකතුව රු.780,534 ක වර්ෂ 20 කට වැඩි කාලයක සිට පැවැත එමින් තිබුණත්, එම ශේෂ අයකර ගැනිමට අමාත්‍යාංශය අපොහොසත් වි තිබුණි.

**3.5 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | |
| (i) මුදල් රෙගුලාසි 115 | 104,832 | ඉකුත් වර්ෂයට අදාළ ගෙවීම් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අනුමැතිය ලබා නොගෙන සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 139 | 159,208 | පුවත් පත් දැන්වීම් පල කිරීම සඳහා වැය කළ රු.159,208 කට අදාළ කුවිතාන්සිපත් 09 ක් විගණනයට ඉදිරිපත් නර නොතිබුණි. |
| **(ආ) කළමනාකරණ සේවා චක්‍රලේඛ** | | |
| (i) 2007 අප්‍රේල් 07 දිනැති අංක 33 දරන චක්‍රලේඛය | - | ප්‍රමුඛතා ව්‍යාපෘති 1,2 හා 3 හි කළමනාකරණ ඒකකයට නිලධාරින් 25 ක් හා ව්‍යාපෘති උපදේශක ඒකකයට නිලධාරින් 81 ක් චක්‍රලේඛය ප්‍රකාරව අනුමැතියක් ලබා නොගෙන බඳවා ගෙන තිබුණි. |
| (ii) - එම - | 2,345,944 | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අනුමැතියක් ලබා නොගෙන මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයන්ට |

| | | |
|---|---|---|
| | | මාර්ග ජාල සංවර්ධන ව්‍යාපාතියෙන් විශේෂ දීමනා ලෙස රු.2,345,944 ක් ගෙවා තිබුණි. |
| **(ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | | |
| 2006 දෙසැම්බර් 26 දිනැති අංක PE/423 දරන චක්‍රලේඛයේ 4 වන ඡේදය | - | සමාලෝචිත වර්ෂය සඳහා මාර්ග නඩත්තු භාර අරමුදලේ වාර්ෂික අයවැය ලේඛනය 2013 සැප්තැම්බර් 15 දින හෝ ඊට පෙර රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය** | | |
| **(i)** 3.1 හා 3.2 මාර්ගෝපදේශ | 119,266,514 | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිව ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන සඳහා උපදේශකවරු 11 දෙනෙකු මූලික විමර්ශන කටයුතු සඳහා සේවයේ යොදවා ගෙන එකතුව රු.119,266,514 ක් ව්‍යාපෘතියෙන් ගෙවා තිබුණි. |
| **(ii)** 8.13.4 මාර්ගෝපදේශය | - | දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ "නිල්වලා ගේට්" ස්මාර්කය ඉදිකිරීමේදී සැකැසූ එලකයේ කොන්ත්‍රාත්තුවේ වටිනාකම රු.4,510,000 ක් වුවත්, කොන්ත්‍රාත්කරු විසින් ඉටු කර තිබුණු රු.2,891,337 ක අමතර කාර්යයන් වෙනුවෙන් විධිමත් අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. |
| **(ඉ) අමාත්‍ය මණ්ඩලයේ තීරණ** | | |
| 2005 ඔක්තෝබර් 26 දිනැති අමාත්‍ය | - | 2006 ජනවාරි 01 දින සිට පෙට්‍රල් හා |

| | |
|---|---|
| මණ්ඩල තීරණයේ 4 ඡේදය | ඩීසල් විකුණුම් වටිනාකමෙන් පිළිවෙලින් රු.1 ක් හා ශත 50 ක් බැගින් ලබා ගෙන මාර්ග නඩත්තු භාර අරමුදලට බැර කළ යුතු වුවත්, මෙම තීරණය ක්‍රියාත්මක කිරිමට අපහසුවීම නිසා මාර්ග නඩත්තු භාර අරමුදල මගින් අපේක්ෂිත ඉලක්ක කරා ළගාවිමට නොහැකි වි තිබුණි. |

**3.6 විදේශාධාර ව්‍යාපෘති**

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් විදේශ මුල්‍යාණය යටතේ ව්‍යාපෘති 29 ක් ක්‍රියාත්මක කර තිබුණි. 2014 වර්ෂයේ විසර්ජන ගිණුම අනුව එහි ඇස්තමේන්තුගත පිරිවැය එකතුව රු.122,257,809,460 ක් වී තිබුණු අතර, එම ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.113,342,363,419 ක් උපයෝජනය කර තිබුණි. මෙම විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

**(අ) විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය**

පහත සඳහන් ව්‍යාපෘතිවල කාර්යසාධනයේ අඩුපාඩු නිරික්ෂණය විය.

**(i) බේස්ලයින් මාර්ග ව්‍යාපෘතිය - අදියර III**

බේස්ලයින් මාර්ග ව්‍යාපෘතියේ - අදියර III යටතේ කිරුළපන සිට කොළඹ - හොරණ මාර්ගයේ දුටුගැමුණු මංසන්ධිය දක්වා වන නව මාර්ගයේ මූලික කාර්යයන් 2009 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. එහි ඉදිකිරීම් කටයුතු 2014 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. මේ සඳහා රු.මිලියන 423.43 ක් වැය කර තිබුණු බැවින් එම වියදම අනාර්ථික වී තිබුණි.

**(ii). ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය - අදියර II**

නියමිත කාලපරිච්ඡේදය තුළ කොන්ත්‍රාත්කරුවන්ගේ බිල්පත්වලට ගෙවීම් නොකිරීම හේතුවෙන් රු.මිලියන 142 ක් ප්‍රමාද පොලී වශයෙන් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණි.

**(iii). ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය - අදියර I**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- නියමිත කාලපරිච්ඡේදය තුළ කොන්ත්‍රාත්කරුවන්ගේ බිල්පත්වලට ගෙවීම් නොකිරීම හේතුවෙන් රු.මිලියන 29.16 ක් ප්‍රමාද ගාස්තු හා පොලී වශයෙන් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණි.
- පරන්තන් මුලතිව් මාර්ගයේ නියමිත පිරිවිතරයන්ට අනුකූලවන පරිදි මාර්ග තලයේ තාර මිශ්‍රණ ඇතිරීමට (Asphalt Concrete) කටයුතු නොකිරීම නිසා ව්‍යාපෘතිය විසින් රු.35,508,531 ක් ගෙවීම් නොකර රඳවාගෙන තිබුණි.

**(iv). සවුදි අරමුදල මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතිය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- 2014 දෙසැම්බර් 31 දින වන විට පහත සඳහන් මාර්ග ඉදිකිරීම් අපේක්ෂිත ඉලක්කයන්ට ළඟා වී නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| මාර්ගය | අපේක්ෂිත ප්‍රගතියේ ප්‍රතිශතය | භෞතික ප්‍රගතියේ ප්‍රතිශතය |
|---|---|---|
| – තම්පලාගාමම් සිට කින්නියා දක්වා මාර්ගයේ තම්පලගමුව සිට සුරංගල් හන්දිය දක්වා කොටස | 100.00 | 82.50 |
| – දෙහිඕවිට - දැරණියගල නුරි මාර්ගය | 75.49 | 43.57 |
| – නුවර-යාපනය මාර්ගයේ පලාපත්වල සිට නාඋල දක්වා වූ කොටස | 85.83 | 22.37 |

- දෙහිඕවිට - දැරණියගල මාර්ගයේ ඉදිකිරීම් සම්බන්ධයෙන් විධිමත් ඉංජිනේරුමය අධ්‍යයනයක් කිරීමෙන් අනතුරුව ප්‍රමාණපත්‍ර සකස් නොකිරීම හේතුවෙන් කොන්ත්‍රාත් පිරිවැය 2014 දෙසැම්බර් 31 දින වන විට රු.154,696,303 කින් වැඩිවී තිබුණි.

**(v).** **හැටන්-නුවරඑළිය මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය**

-----------------------------------------------------

ලිඳුල හන්දියේ සිට මීටර් 200 ක පමණ ප්‍රමාණයක් ඩයගම මාර්ගයේ, මාර්ග තලය තාර මිශ්‍රණ (Asphalt Concrete) අතුරා වැඩි දියුණු කර තිබුණි. මේ සඳහා රු.2,828,200 ක අතිරේක වියදමක් කර තිබුණද, එය ව්‍යාපෘතියේ විෂය පථයට අයත් කාර්යයක් වී නොතිබුණි.

**(vi).** **ජාතික මාර්ග ආංශික ව්‍යාපෘතිය**

--------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- මාතර - ගොඩගම මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතුවල විෂය පථය වෙනස්වීම හේතුවෙන් මාතර රාහුල විද්‍යාලයේ තාප්පය ඉදිකිරීමට රු.මිලියන 14 ක්ද, ජලාපවාහන පද්ධතිය නැවත ස්ථානගත කිරීම සඳහා රු.මිලියන 25 ක අමතර වියදමක්ද කර තිබුණි.
- කොන්ත්‍රාත් ගිවිසුම අනුව කොන්ත්‍රාත් උපදේශක වෙත පහසුකම් සැලසිය යුතුව තිබුණද, ජාතික මාර්ග ආංශික ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු විසින් රු.4,640,023 කට පළමු පන්තියේ නිවසක්, කොන්ත්‍රාත් ගිවිසුමට පටහැනිව සපයා තිබුණි. කෙසේවුවද, මේ සඳහා ගෙවූ මුදලින් රු.2,320,012 ක් අංක 13 දරන අතුරු ගෙවීම් වාර්තාවෙන් අයකර ගෙන තිබුණි.

**(vii).** **මාර්ග අංශ සහායක ව්‍යාපෘතිය**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ව්‍යාපෘතිය ආරම්භක අදියරේදී මාර්ග ඉදිකිරීම් කටයුතු පිළිබඳව ඵලදායී විමර්ශනයක් කර නොතිබුණු අතර ව්‍යාපෘතියේ පිරිවැය විධිමත් පරිදි ඇස්තමේන්තු කර නොතිබුණි. මේ හේතුවෙන් මාර්ග 04 කට අදාලව පිරිවැය විචලනයන් සියයට 12.6 ක සිට සියයට 18.3 ක් දක්වා වූ පරාසයක ප්‍රමාණයකින් වැඩිවී තිබුණි. මේ හේතුවෙන් එකතුව රු.මිලියන 603.82 ක් විචලතා නියෝග මත ගෙවීමට සිදු වී තිබුණි.
- හික්කඩුව සිට දක්ෂිණ අධිවේගී මාර්ගය දක්වා මාර්ගය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවට අදාල නොවූ ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට අයත් ජලාපවාහන පද්ධතිය නැවත ස්ථානගත කිරීම සඳහා රු.මිලියන 78.8 ක් ව්‍යාපෘතියෙන් වැය කර තිබුණි. එයට අමතරව විධායක

ඉංජිනේරුවරයාට කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම, හික්කඩුව හා ගෝනාපීනුවල තැපැල් කාර්යාලවල ආරක්ෂිත තාප්ප ඉදිකිරීම සඳහාද රු.මිලියන 5.74 ක් වැයකර තිබුණි.

- දේශීය උපදේශකයන් පත්කිරීමේ ලිපි අනුව එම නිලධාරීන්ට, ඔවුන්ගේ වැටුප හැර වෙනත් දීමනා සඳහා හිමිකම් නොමැති නමුත් එම නිලධාරීන් වෙත ඉන්ධන දීමනා හා ගමන් වියදම් වශයෙන් පිළිවෙලින් රු.2,880,000 ක් හා රු.1,418,792 ක් ගෙවා තිබුණි.
- මාතර සිට ගොඩගම දක්වා වූ මාර්ගයේ, ප්‍රමාණපත්‍රයේ (BOQ) 8.2.2 ඡේදයේ යටතේ සඳහන් පින් කර්බ් ප්‍රමාණය සමාලෝචිත වර්ෂය අවසන් වන විට භාවිතා කර තිබුණු පින් කර්බ් ප්‍රමාණය හා සැසඳීමේදී දිග මීටර් 6,272 ක ප්‍රමාණයකට අදාළ පින් කර්බ් ප්‍රමාණයක් ඉතිරිව පැවතුණි. එසේ තිබියදී දිග මීටර් 2,198.6 ක් සඳහා රු.5,496,500 ක් වටිනා පින් කර්බ් ප්‍රමාණයක් විචලතා නියෝග 2 ක් යටතේ මිලදී ගෙන තිබුණි.

**(viii). උතුරු අධිවේගී මාර්ග ව්‍යාපෘතිය**

ඉහත සඳහන් මාර්ගයේ ඉදිකිරීමේ අදියර 03 ක් සඳහා ශක්‍යතා අධ්‍යයනය (Feasibility study) කිරිම සඳහා රු.986,380,104 ක කොන්ත්‍රාත් වටිනාකමකට පුද්ගලික සමාගමක් වෙත පවරා තිබුණි. ඒ අනුව එඬේරමුල්ල සිට මීරිගම දක්වා පළමු අදියර ලෙසද, මීරිගම සිට කුරුණෑගල දක්වා දෙවන අදියර ලෙස හා කුරුණෑගල සිට මහනුවර දක්වා තුන්වන අදියර ලෙසද හඳුනාගෙන ශක්‍යතා අධ්‍යයනය සිදුකර තිබුණි. මෙම අදියරයන් පසුව වෙනස් කර තිබුණ අතර සම්ලෝචිත වර්ෂය අවසන් වන විට එඬේරමුල්ල සිට ගම්පහ දක්වා ශක්‍යතා අධ්‍යයන කටයුතු කොන්ත්‍රාත්කරු විසින් නිම කර තිබුණි. කෙසේ වෙතත්, පසුව ව්‍යාපෘතියේ අදියරයන් කඩවත සිට ගම්පහ ලෙස සංශෝධනය කර තිබුණු අතර ඒ හේතුවෙන් එඬේරමුල්ල සිට ගම්පහ දක්වා සිදුකරන ලද ශක්‍යතා අධ්‍යයන කටයුතු වෙනුවෙන් කළ වියදම නිෂ්ඵල වියදමක් වී තිබුණි.

**(ix). ඔපෙක් අරමුදල් මාර්ග ජාල ව්‍යාපෘතිය**

කොන්ත්‍රාත් ගිවිසුමේ 14.8 (General Condition) ඡේදය අනුව නියමිත දිනට බිල්පත් නිරවුල් නොකිරීම නිසා ඔපෙක් අරමුදල් මාර්ග ජාල සංවර්ධන

ව්‍යාපෘතිය යටතේ රු.1,585,810 ක් ප්‍රමාද ගාස්තු හා පොලී වශයෙන් ගෙවිය යුතුව තිබුණි.

**(ආ) ව්‍යාපෘතියේ වත්කම් ඌන උපයෝජනය/නිෂ්ක්‍රියව පැවැතිම**

**------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය - අදියර II හි කටයුතු 2014 ජූනි 28 දින නිම කිරීමට නියමිතව තිබුණි. 2014 ජූනි 11 දින රු.2,708,184 ක් වැය කර භූලක්ෂණ තොරතුරු මෘදුකාංගයක් මිලදී ගෙන තිබුණි. ව්‍යාපෘතිය අවසන් වීමට ආසන්නයේදී මෙවැනි මිලදී ගැනීමක් සිදුකිරීමේ අවශ්‍යතාවය විගණනයේදී පැහැදිලි නොවුණි.

**(ii)** මාර්ග අංශ සහායක ව්‍යාපෘතියේ ජලාපවාහන කටයුතු වෙනුවෙන් මිලදී ගන්නා ලද රු.මිලියන 84 ක් වටිනා ජලනල උපකරණ වර්ෂ 2 ක කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන ව්‍යාපෘති භූමියේ ගබඩා කර තිබුණි.

**(iii)** ප්‍රාදේශීය පාලම් ව්‍යාපෘතිය යටතේ රු.70,190,859 ක් වටිනා පාලමක් කුලියාපිටිය - අලපලාදෙණිය මාර්ගයේ ඉදිකිරීමට 2010 අප්‍රේල් 08 දින හා 2010 අගෝස්තු 16 දින කුලියාපිටිය විධායක ඉංජිනේරු වෙත ලබාදී තිබුණද වර්ෂ 05 ක කාලයක් ගතවීමෙන් පසුවද එම ඉදිකිරීම් සම්පූර්ණ කර නොතිබුණි. මේ හේතුවෙන් මෙම ස්ථානය වෙත ප්‍රවාහනය කර තිබූ පාලම් අමතර කොටස් නිෂ්ක්‍රීයව පැවතුණි.

**(iv)** කොටගල උමං මාර්ගය වෙනුවෙන් රු.2,113,008 ක් වටිනා වැඩිපුර සකස් කර තිබුණු ගරාදි ආරුක්කු (Lattice Arches) 04 ක් ප්‍රයෝජනයට නොගෙන නෝවුඩ් විධායක ඉංජිනේරු කාර්යාල භූමියේ අනාරක්ෂිතව ගබඩාකර තිබුණි.

**(ඇ) ව්‍යාපෘතිය නියමිත දින ආරම්භ නොකිරීම**

**------------------------------------------------**

පාමංකඩ - කැස්බෑව මාර්ගය සඳහා වූ කොන්ත්‍රාත් ගිවිසුම 2012 ඔක්තෝබර් 01 දින අත්සන් කර තිබුණද, මාස 06 ක ප්‍රමාදයකින් පසුව 2013 මාර්තු 25 දින පළමු අදියර ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා මාර්ගය කොන්ත්‍රාත්කරු වෙත භාරදී තිබුණි. තවද, දෙවන අදියර සඳහාවූ මාර්ගය 2014 මැයි 20 දින භාරදී තිබුණි. මේ හේතුවෙන් මෙම මාර්ගය සඳහා වූ ප්‍රමාණපත්‍රවල වටිනාකම රු.මිලියන 30.36 කින් වැඩිවී තිබුණි. මෙම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් ඉඩම් පවරාගැනීම් ක්‍රියාවලිය ප්‍රමාදවීම හා විදුලිය, ජලය වැනි උපයෝගී සේවා නැවත ස්ථානගත කිරීමේ ප්‍රමාදයන් මේ කාල

ප්‍රමාදයන්ට හේතුවිය. ව්‍යාපෘති ඉංජිනේරුගේ ඇස්තමේන්තුව අනුව මූලික කටයුතු හා සාමාන්‍ය කටයුතු සඳහා වූ ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 145.33 ක් වුවත්, කොන්ත්‍රාත්කරු විසින් ඒ සඳහා රු.මිලියන 256 ක් ඉදිරිපත් කර තිබුණි. කෙසේවුවත්, රේටයන්ගේ විශ්ලේෂණයක් සිදු නොකර කොන්ත්‍රාත්කරුගේ මිල ගණන් පිළිගෙන ඒ අනුව ගෙවීම් සිදුකර තිබුණි.

## 3.7 කාර්යසාධනය

--------------

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) මඟනැඟුම ව්‍යාපෘති

---------------------

මඟ නැගුම ව්‍යාපෘති සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

#### (i). හම්බන්තොට දිස්ත්‍රික්කය

----------------------------

හම්බන්තොට දිස්ත්‍රික්කයේ අඟුණකොළපැලැස්ස, කටුවන හා තිස්සමහාරාම යන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ තුළ පිහිටි ග්‍රාමීය මාර්ග අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටිගල් ඇතිරීම පිළිබඳව සිදුකරන ලද විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

#### (ii). අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව

------------------------------------------

ලිපිගොනු පරීක්ෂාවේදී හා ව්‍යාපෘතිවල භෞතික පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

- 2013 මැයි 03 දිනැති හා අංක 2013/2 දරන මඟනැඟුම චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව පරීක්ෂණයන් කිරිම සඳහා ඉදිරිපත් කළ හැකි ලෙස විධිමත් ලෙස ලිපිගොනු පවත්වා නොතිබුණි.
- අඟුණකොළපැලැස්ස ඉදිගැටවෙල සුසානභූමිය මාර්ගයේ I අදියර සඳහා රු.500,000 ක් වැයකර කොන්ක්‍රීට් කුට්ටිගල් අතුරා සංවර්ධනය කර තිබුණද, එකී ස්ථානයේ සුසානභූමිය සඳහා භූමියක් වෙන්කිරීම පමණක් සිදුකර තිබුණි. තවද එම මාර්ගය භාවිතා කරන පදිංචිකරුවන් ද පිළිබඳ තොරතුරුද ඉදිරිපත් වී නොතිබුණි.

**(iii).** **කටුවන ප්‍රාදේශීය සභාව**

**----------------------------**

හෞතික පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

- මාර්ගයන් 2 ක ඉටුනොකරන ලද කාර්යයන් වෙනුවෙන් රු.20,079 ක් ගෙවීම් කර තිබුණි.
- මාර්ගය සැකසීමේදී ප්‍රතිලාභීන් සංඛ්‍යාව පිළිබඳව අවධානය යොමු නොකර ප්‍රතිලාභීන් 2 ක් හෝ 3 ක් වෙනුවෙන් මාර්ග සකසා තිබුණි.
- ඉදිකිරීම් කටයුතු නිරන්තරයෙන් අධීක්ෂණය කළ බව සනාථ කිරීම සඳහා කිසියම් මාර්ගයකට හෝ මාර්ග පන්තියක් වෙනුවෙන් ලොග් සටහන පවත්වා නොතිබුණි.
- මාර්ග හෞතික පරීක්ෂාවේදී මාර්ග දෙපස උරහිස් පස් පුරවා සකස් නොකිරීම, මාර්ග දෙපස කොන්ක්‍රීට් බැම් පුපුරා යාම, මාර්ගය මැදින් යොදා ඇති කොන්ක්‍රීට් බැම් පුපුරා යාම, මාර්ගයන්හි ගිලාබැසීම්, දෙපස කානු පද්ධති සකස් නොකිරීම හා සම්බන්ධිත මාර්ගයන්හි නඩත්තු කටයුතු සිදුනොකිරීම වැනි අඩුපාඩු පැවැතුණි.
- කටුවන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොන්ක්‍රීට් කුට්ටිගල් අතුරා තිබූ මාර්ගයන් හෞතික පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.
  - ජාතික හෝ පළාත්බද මාර්ගයකට සම්බන්ධ නොවන මාර්ගයක් තෝරාගැනීම, කොන්ක්‍රීට් ගල් ඇතිරිමට පෙර මාර්ගය නිසි පරිදි තැලීමට කටයුතු නොකිරීම, කොන්ක්‍රීට් ගල් අතර ගල්කුඩු හෝ වැලි යොදා සවිනොකිරීම, මාර්ගයේ මතුපිට තැනින් තැන ගිලාබැසීම් සිදුවීම, මාර්ගය දෙපස කොන්ක්‍රීට් බැම් හා කොන්ක්‍රීට් ගල් අතුරා ඇති ප්‍රදේශයන්හි පරතර පැවතුණි.

**(iv).** **තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව**

**--------------------------------**

ලිපිගොනු පරීක්ෂාවේදී හා ව්‍යාපෘති පිළිබඳ හෞතික පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

- කොන්ත්‍රාකරුවන් සමඟ එළඹ තිබූණු ගිවිසුම අනුව රු.500,000 කට ආසන්න වටිනාකමකින් යුතු ඉදිකිරීම් වෙනුවෙන් මාස 06 කාලයක් ලබාදී තිබුණි. මේ හේතුවෙන් ඉදිකිරීම් කටයුතු ප්‍රමාදවී තිබුණි.

- මාර්ග සංවර්ධනය ව්‍යාපෘති ක්‍රියත්මක කිරීමේදී ප්‍රතිලාභීන් සංඛ්‍යාව සැලකිල්ලට නොගෙන ප්‍රතිලාභීන් 02 ක් හෝ 03 ක් පමණක් පදංචි වී සිටින මාර්ගයන් තෝරාගෙන සංවර්ධනය කර තිබුණි.

- භෞතික පරීක්ෂාවේදී මාර්ගය නිසිලෙස සමතලා කොට කොන්ක්‍රීට් ගල් ඇතිරිමට කටයුතු නොකිරීම නිසා මාර්ගයේ මතුපිට සමතලව නොපැවතීම, සම්බන්ධිත මාර්ගයන් නොමැති ප්‍රදේශ තෝරාගැනීම හා මාර්ගයේ කොන්ක්‍රීට් යොදා ඇති ප්‍රදේශ ඉරිතැලීම් සිදුවීම වැනි අඩුපාඩු පැවැතුණි. තවද, නිසිපරිදි මට්ටම් කර පාදම සකස් නොකිරීම නිසා මාර්ගය තැනින් තැන ගිලා බැස තිබුණි.

- මාර්ගයේ කුට්ටිගල් ඇතිරීමෙන් පසු මට්ටම් කර සිහින් වැලි යොදා කුස්තුර පුරවා සකස්කිරීම වෙනුවෙන් රු.60,000 ක් ඇස්තමේන්තු කර තිබුණද භෞතික පරීක්ෂාවේදී ප්‍රමාණවත් පරිදි මාර්ගය මතුපිට සිහින් වැලි යොදා කුස්තුර පුරවා නොතිබුණු අවස්ථා පැවැතුණි.

- තිස්සමහාරාම අන්දරගස්යාය පෙර පාසල අසල මාර්ගයේ මීටර් 70 මායිම් කොටසේ ස්ථාන කීපයක ගල් උඩට ඉස්සී තිබූ අතර එම මාර්ගයේ කෙළවර කොටසේ ගල් අක්‍රමවත්ව අතුරා තිබුණි. මාර්ග තලය මට්ටම් කිරීම සඳහා රු.23,011 ක් ගෙවා තිබුණි.

- මාගම අක්කර විස්ස මාර්ගය (I අදියර මාර්ගයේ) අග කොටසේ ගල් ඉස්සී පැවැතුණි. මාර්ග තලය යන්ත්‍රානුසාරයෙන් මට්ටම් කර සණවත් කිරීම සඳහා රු.23,011 ක් ගෙවා තිබුණි.

**(v). කුරුණෑගල දිස්ත්‍රික්කය**

-------------------------

මහව විධායක ඉංජිනේරු කොට්ඨාශය, කුරුණෑගල ප්‍රාදේශීය සභාව සහ අලව්ව ප්‍රාදේශීය සභාවල මහනැඟුම ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කළ ග්‍රාමීය පාරවල් සම්බන්ධයෙන් කළ නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- මහව විධායක ඉංජිනේරු කාර්යාලය, උස්ගල, සියඹලන්ගමුව දියවර ගම්මානයේ අදියර අංක 47 හා 48 දක්වාවූ මාර්ග කොටසේ ඉදිකරන ලද මාර්ගවල දුර මැනීමේදී අදාළ මිනුම් පත්‍රය අනුව තිබිය යුතු දුර ප්‍රමාණයට

වඩා අඩුවෙන් භෞතික පරීක්ෂාවේදී පැවති දුර පැවැති බැවින් ගෙවිය යුතු මුදලට වඩා රු.493,024 ක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි.

- 42 අදියර මාර්ගයේ දෙපස බොරළු පස් යොදා පුරවා මාර්ග තලනයකින් නිසි පරිදි තලා නොතිබූ අතර මේ හේතුවෙන් කොන්ත්‍රාත්කරුට රු.162,987 ක් වැඩිපුර ගෙවා තිබුණි.
- 48 අදියර මහා මාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ 2007 පෙබරවාරි 26 දිනැති අංක 2007/01 දරන චක්‍රලේඛය ප්‍රකාර සංවර්ධන කටයුතු සඳහා මාර්ග තෝරාගැනීමේදී ජාතික හෝ පළාත් මාර්ගයකට සම්බන්ධ වන මාර්ගයක් පමණක් තෝරාගත යුතු වුවත්, ඒ පිළිබඳ සැලකිල්ලට නොගෙන එක් පෞද්ගලික නිවසකට පමණක් පිවිසෙන සියඹලන්ගමුව දියවර ගම්මානයේ 48 වන මාර්ගය ඉදිකර තිබූ බැවින් ඒ සඳහා වැය කරන ලද රු.963,812 කින් නිසි ආර්ථික ප්‍රතිලාභ ලබාගෙන නොතිබුණි.
- ප්‍රාදේශීය සභාවන් විසින් වර්ගමීටර් 1 ක ප්‍රමාණයක කොන්ක්‍රීට් ගල් අතුරා සංවර්ධන කිරීම වෙනුවෙන් රු.2,536 ක් වැය කර තිබුණද, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඒ සඳහා රු.4,048 ක් වැය කර තිබුණි. මේ හේතුවෙන් උස්සල සියඹලන්ගමුව මාර්ගයේ වර්ග මීටර් 3,963.3 ක ප්‍රදේශයක මාර්ග සංවර්ධනය වෙනුවෙන් ප්‍රාදේශීය සභාව විසින් කර තිබුණු වියදමට වඩා රු.6,707,770 ක් වැනි වැඩි වියදමක් කර තිබුණි.

**(vi).** **කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය**

**--------------------------------------------**

ඉදිකිරීම් භෞතික පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

- මාර්ග සැකසීම සඳහාවූ ප්‍රමාණ පත්‍රවල මාර්ගයේ දෙපස කොන්ක්‍රීට් බැම්වල උස අඟල් 8.3 ක් ලෙස දක්වා තිබුණද භෞතික පරීක්ෂාවට ලක්කල මාර්ගයන්වල උසස් අඟල් 08 ක සිට අඟල් 05 ක් දක්වා පරාසයකද, දෙපස බැම්වල උස අඟල් 6 ක්වූ අතර මාර්ගයන් 3 ක දෙපස බැම්වල උස අඟල් 7 ක් විය. මේ හේතුවෙන් මාර්ගයේ ආරක්ෂාව පිළිබඳව සෑහීමට පත්විය නොහැකි විය.
- මාර්ගයේ සංවර්ධනය කළ හැකි ප්‍රදේශය නිශ්චිතව හඳුනා නොගැනීම, පළාත් හෝ ජාතික මාර්ගයකට සම්බන්ධ වන මාර්ගයන් තෝරා නොගැනීම,

මාර්ග උරහිස් බොරළු දමා සකස් නොකිරීම හා මාර්ගවල ඇතැම් ස්ථානවල ගල් ගිලා බැසීම ආදි අඩුපාඩු පැවැතුණි.

**3.8 බැංකු ගිණුම්**

අමාත්‍යාංශයට අදාළ බැංකු ජංගම ගිණුමේ 2014 දෙසැම්බර් 31 දින වන විට නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ කල් ඉකුත් වූ රු.120,229 ක චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි**.**

**3.9 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| **(i)** | ජ්‍යෙෂ්ඨ මට්ටම | 27 | 18 | 09 |
| **(ii)** | තෘතියික මට්ටම | 04 | 03 | 01 |
| **(iii)** | ද්විතියික මට්ටම | 606 | 354 | 252 |
| **(iv)** | ප්‍රාථමික මට්ටම | 32 | 24 | 08 |
| | එකතුව | **669** | **399** | **270** |